ශ්‍රී ලංකා මහ බැංකුව

இலங்கை மத்திய வங்கி

CENTRAL BANK OF SRI LANKA

# ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පීඑල්සී (බලපත්‍රය අවලංගු කරන ලද) ආයතනයේ තැන්පතුකරුවන් වෙත ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ

## රක්ෂණ වන්දි මුදල් ගෙවීම

ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පීඑල්සී ආයතනයේ සුදුසුකම්ලත් තැන්පතුකරුවන්/අදාළ තැන්පතුකරුවන්ගේ නීත්‍යානුකූල උරුමකරුවන් වෙත ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ රක්ෂණ වන්දි මුදල් ගෙවීම 2023.06.09 වන දින සිට නැවත ආරම්භ කර 2024.07.12 දක්වා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව නිවේදනය කරනු ලබයි. නමුත් ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පීඑල්සී ආයතනය ඈවර කිරීම සම්බන්ධයෙන් නිසි අධිකරණයක් මගින් ඈවරකරුවෙකු 2024.07.12 දිනට ප්‍රථමව පත් කළහොත් එදින සිට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ රක්ෂණ වන්දි මුදල් ගෙවීම සිදු කිරීම නවත්වනු ලැබේ.

ඒ අනුව, 2023.06.09 වන දින සිට මහජන බැංකුවෙහි ඕනෑම ශාඛාවක් වෙත නියමිත ලේඛන ඉදිරිපත් කර උපරිමය රු 1,100,000 යටත්ව තමන්ට හිමි වන්දි මුදල් ලබා ගන්නා ලෙස දැනට සම්පූර්ණ රක්ෂණ වන්දි මුදල් ලබා නොගත් සුදුසුකම්ලත් තැන්පතුකරුවන්/ අදාළ තැන්පතුකරුවන්ගේ නීත්‍යානුකූල උරුමකරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

විමසීම්: 0112 477 261, 0112 477 977

නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව